# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවළුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1) ශිෂ්‍ය විනය පාලක II ශ්‍රේණිය

**සුදුසුකම් :**

**1.** පිළිගත් විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක උපාධියක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| වයස | : | අවුරුදු 30 ත් 45 ත් අතර විය යුතුය. |
| ශාරීරික සුදුසුකම් (පිරිමි) | : | උස - අඩි 5 අඟල් 5<br>පපුව - අඟල් 32 |
| ශාරීරික සුදුසුකම් (ගැහැණු) | : | උස - අඩි 5 අඟල් 4 |

**සටහන**

පොලිස් හෝ සන්නද්ධ හමුදා සේවයෙහි අත්දැකීම් ඇති සහ විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රීඩා හා සමාජ සුභසාධන කටයුතුවලට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වූ අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**හෝ**

**2.** සන්නද්ධ හමුදා සේවයන්හි මේජර් නිලයක් හෝ ශ්‍රී ලංකා පොලිස් සේවයේ එයට සමාන නිලයක හෝ ඊට නොඅඩු නිලයක පළපුරුද්දක් ඇති අයවළුන්.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | **:** | U-MN 3 (II) - රු**.** 71,365- 18x1,190-92,**785** (මාසික) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | **:** | ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් |

## 2) කළමනාකරණ සහකාර III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. අ.පො.ස (සා.පෙළ) විභාගය සිංහල භාෂාව/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.

**සහ**

**2.** අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වීම ප්‍රමාණවත් වේ.)

**3.** පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**a.** පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත් සුදුසුකමක්

**සහ**

**b.** පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**සටහන : සුදුසුකම්**

අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය.

| | | |
|---|---|---|
| **වැටුප් ක්‍රමය** | : | රු. 49,475 - 17 **x** 540 - 58,655 මාසික - **U MN 1 (III )** |
| **බඳවා ගනු ලබන ආකාරය** | : | ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (25%) මගින් |

ලිඛිත පරීක්ෂණය සඳහා පහත සඳහන් විෂය පථ පිළිබඳ දැනුම සලකා බලනු ලැබේ.

- සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම
- බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම
- පරිගණක දැනුම

**3) වැඩ සහායක III ශ්‍රේණිය**
**4) පුස්තකාල සහයක III ශ්‍රේණිය**
**5) ක්‍රීඩාපිටි භාරකරු III ශ්‍රේණිය**
**6) උද්‍යානකරු III ශ්‍රේණිය**

ඉහත අංක 3,4,5 සහ 6 තනතුරු සඳහා

**සුදුසුකම්:**

අ.පො.ස.(සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකට නොඅඩු සංඛ්‍යාවක් සමඟ සමත්ව තිබිය යුතුය**.**

| | | |
|---|---|---|
| වයස | **:** | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |

**වෙනත් : සෑම අයදුම්කරුවකුම,**

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ආ) තනතුරේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.
ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | **:** | **U PL 1 (III) -** රු.**42,775 – 16 x 450** – **49,975** (මාසික) |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | **:** | වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

තෝරාගත් අපේක්ෂකයා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයෙකු වනු ඇත. ඔහු/ඇය තම මාසික වැටුපෙන් **10%** ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වන අතර ඒ සමඟම, සේවායෝජකයා විසින් සේවකයාගේ වැටුපෙන් **15%** කට සමාන මුළු දායකත්වයක් ලබා දෙනු ඇත, එයින් **8%** ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට සහ **7%** ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කෙරේ. **1980** අංක **46** දරන සේවක භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් සියයට තුනක් **(3%)** සේවක භාර අරමුදලට දායක වේ. ඊට අමතරව, විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය. (**https://cmb.ac.lk/vacancies)**

සියලුම අයදුම්පත් පහත සබැඳිය යටතේ ඇති ගූගල් පෝරමය පුරවා ඉදිරිපත් කළ යුතුය.

https://cmb.ac.lk/apply

ගූගල් පෝරමය ඉදිරිපත් කිරීමෙන් පසුව අයදුම්කරුගේ විද්‍යුත් තැපැලට ලැබෙන **PDF** ලේඛනයේ දෘඩ පිටපතක් අයදුම්කරුගේ අත්සන සහිතව එවීම **අනිවාර්ය** වන අතර, දෘඩ පිටපත ඉදිරිපත් නොකිරීම තේරීම් ක්‍රියාවලියෙන් නුසුදුස්සෙකු වීමට හේතු වේ. අයදුම්කරු දැනට උසස් අධ්‍යාපන ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක සේවය කරන්නේ නම්, ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ද අයදුම්පතට ඇතුළත් කළ යුතුය.

ඊට අමතරව අදාළ අධ්‍යාපනික, වෘත්තීය, විෂය බාහිර සහ සේවා සහතිකවල සහතික කළ පිටපත් ද ඉහත සඳහන් කරන ලද අයදුම්පතට අමුණා **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, කොළඹ විශ්වවිද්‍යාලය**, 94, **කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ** 03 වෙත **2025.10.07** දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. **අසම්පූර්ණ, අතින් ලියන ලද, සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සහතික කළ පිටපත් අමුණා නොමැති සහ ආකෘති පත්‍ර භාවිතයෙන් ඉදිරිපත් කරන ලද හෝ**

**අයදුම්පත් කැඳවන අවසන් දිනට පසුව ලැබෙන** අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් කිසිදු තත්වයක් යටතේ නැවත සලකා බලනු නොලැබේ.

රජයේ දෙපාර්තමේන්තු**,** සංස්ථා සහ / හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් එම ආයතනවල ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතු අතර ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03

2025.09.18